124

# ශ්‍රී ලංකාවේ කාර්යබද්ධ සාක්ෂරතාව තැංවීම සඳහා නොවිධිමත් අධ්‍යාපන අවස්ථා තුළින් දියත් කළහැකි ව්‍යාපෘතියක් පිළිබඳ විමසීමක්.

(කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රදේශයේ ධීවර)
පැල්පත් ආශ්‍රිතව.

UCLIB
453117

චන්ද්‍රානි ජෙස්මින් සිටුගේ.
B.A., Dip.Ed.(Merit),M.A.

අධ්‍යාපන දර්ශනපති. M.Phil. 14
1996 මාර්තු.

453117

Class No.
Acc. No.

University of Colombo Library Sri Lanka

## සංක්ෂේපයන් .

ශ්‍රී ලාංකිකයන් වශයෙන් අද අප ජීවත් වන්නේ කාන්තාවන් රජයන සමාජයකය. දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළම තල දෙකක් වන ජනාධිපති හා අගමැති තනතුරු හොබවන්නේ කාන්තාවන් දෙදෙනෙකි. එය කාන්තා ආධිපත්‍යය පිළිබඳ ශුභවාදී දර්ශනයකි. කාන්තාවකගේ දියුණුව මුළු මහත් ජාතියේම දියුණුවට මංපෙත් පාදන්නක් නිසා එය වැදගත් සිදුවීමක් ලෙස සැළකිය හැක. එසේ වුවත් අද දවසේ පවා කාන්තාවන්ගේ අධ්‍යාපනික හා සමාජ ආර්ථිකභාවය, නීතිමය ආරක්ෂිත භාවය පිළිබඳව විවිධ ඌණතා දක්නට ඇත.

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ කාර්යබද්ධ සාක්ෂරතාව නැංවීම සඳහා දියත් කළ හැකි ව්‍යාපෘතියක් පිළිබඳ විමසීමක් කෙරේ. එහිදී මේ කර්තව්‍ය මෙහෙයවනු ලබන්නේ නොවිධිමත් අධ්‍යාපන අවස්ථා තුළිනි. විධිමත් අධ්‍යාපනය අද බොහෝ දෙනාගේ විවේචනයට පාත්‍ර වී ඇත්තේ එය බලවන්තයන් තවත් බලවන්තයන් කරන වරප්‍රසාද අහිමි පීඩිතයන් තවත් පීඩාකාරී තත්වයට පත් කරන උගතාට උගන්වන, නූගතා නෙරපා දමන අත්තනෝමතික, අනම්‍ය, අයාර්ථික ක්‍රියාවලියක්වීම නිසාය.

සාක්ෂරභාවය යනු හුදෙක් අකුරු ලිවීමට කියවීමට හෝ ගණනයට සීමා වුවක් නොවේ. එය ජීවිතයට සම්බන්ධ විය යුත්තකි. පුද්ගලයාගේ හා සමාජයේ එදිනෙදා ක්‍රියාදාමයේදී දායකවීමට යමෙකුට හැකිනම් එය අර්ථවත් සාක්ෂරතාවයක් ලෙස කිවහැකිය. එබැවින් මෙම අධ්‍යයනයේදී උත්සාහය වන්නේ එවන් ව්‍යවහාරික සාක්ෂරතාව ඇතිකරලීමය.

සමස්ත ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේද සාක්ෂරතාව සමීක්ෂණයට ලක්කරන විට පෙනී යන සත්‍යයකි අසාක්ෂරබවෙන් පෙළෙන කාන්තාවන්ගේ සංඛ්‍යාව පුරුෂ

පක්‍ෂයේ සංඛ්‍යාවට වඩා වැඩිවීම. අනිවාර්ය ප්‍රාථමික අධ්‍යාපනය සියල්ලන්ටම ලබාදීමට නම්, ක්‍රි.ව.2000 දි මුළුමහත් ලෝකවාසී ජනතාවට අධ්‍යාපනය ලබාදීමට නම් කාන්තාව දැනුවත් කරවීම ඉතා වැදගත්ය.

කාන්තාවගේ අධ්‍යාපන තත්වයත්, දරුවන්ගේ පෝෂණය, සෞඛ්‍ය තත්‍වය, දුප්පත්කම අතර පැහැදිලි සම්බන්ධයක් ඇති බව මේ දක්වා ශ්‍රී ලංකාව හා ලෝකයේ විවිධ රටවල් විසින් මෙහෙයවා ඇති අධ්‍යයනයන්ගෙන් හෙලිවී ඇත. එබැවින් කාන්තාව දැනුවත් කිරීමේ ක්‍රියාමූලික පරීක්‍ෂණයක් මාස තුනක් ඇතුළත දියත් කර ඉන් ලබා ගන්නා තොරතුරු ඇසුරින් මෙම නිබන්ධනය සකස් කිරීම මෙහි ප්‍රධාන අරමුණ ලෙස හඳුන්වා දිය හැක.

මෙම අධ්‍යයනයේදි කෙරෙන අත්හදා බැලීම් ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලැබුයේ පානදුර නාගරික ප්‍රදේශයක ජීවත්වන අඩු වරප්‍රසාද භුක්ති විඳින, දුප්පත්, ධීවර කාන්තාවන් 15ක් දෙනෙකි. කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රදේශයේ උයන් කැලේ ග්‍රාම සේවක කොට්ඨාශයේ ගෙවල් 69 ක මූලික සමීක්‍ෂණයකින් පසුව මෙකී කාන්තාවන් 15 ක් දෙනා තෝරා පානදුර (වැලිපිටිය) අභය මුවලින්දාරාම විහාරස්ථානයද සතියකට දින දෙකක් බැගින් මාස තුනක් ව්‍යවහාරික කාන්තා සාක්‍ෂර වැඩ සටහනක් දියත් කරන ලදි. කියවීමට, ලිවීමට හා ගණනය කිරීම් හුදෙක් පොතට සීමා නොකර කාන්තා කාර්ය භාරයේදි වැදගත් තැනක් ගන්නා දාරකාරක්‍ෂාව, පෝෂණය, පවුල් සංවිධානය, සෞඛ්‍ය හා සනීපාරක්‍ෂාව, යන අංශවලින් දැනුවත් කරමින් ඉවුම් පිහුම්, විසිතුරු භාණ්ඩ නිර්මාණය කිරීම් වැනි කෞශල්‍යතා ඔප්නැංවීමට අවස්ථාව සලසාදීමෙන්ද වන්දනා ගමනකට සහභාගි කරගනිමින් ඔවුන් සාමාජික හා මානසික ප්‍රබෝධයට අවස්ථාව සලසාදීමෙන්ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

සමීක්‍ෂණයේදි, ලබාගත් තොරතුරු ආශ්‍රිතව අදාළ ප්‍රදේශයේ සාක්‍ෂරතාවය ව්‍යාප්තවී ඇති ආකාරයත්, එම ජනතාවගේ සමාජ ආර්ථික තත්වයන් විමසන ලදි. එමෙන්ම ව්‍යාපෘතියට සහභාගිවන කාන්තාවන්ගේ අධ්‍යාපනික මට්ටම හා සමාජ ආර්ථිකතත්වය පිළිබඳ ගැඹුරින් අධ්‍යයන කරන ලදි. ඉහත සඳහන් පරිදි

University of Colombo Library

සමීක්ෂණයෙන් හා අත්හදා බැලීම් ව්‍යාපෘතියෙන් ලද දත්ත උපයෝගිකරගනිමින් දුප්පත්කම හා සාක්ෂරභාවය අතර සබඳකමක් තිබේදැයි විමසා බලන ලදි.

එම දත්ත ඇසුරින් කරන ලද නිගමන අනුව කාන්තාවන්ට කාර්යබද්ධ සාක්ෂරභාවය වඩා විධිමත්ව ලබාදීම සම්බන්ධව යෝජනා ඉදිරිපත් කර ඇත. අවසාන වශයෙන් ධීවරකාන්තාවන්ට කාර්යබද්ධ සාක්ෂර භාවය ලබාදීමේදී සාර්ථක මෙන්ම අසාර්ථකවීම් තුළින්ද, පෙළඹවීම් මෙන්ම ඇතිවූ බාධාවන් ද සැළකිල්ලට ගනිමින් ප්‍රතිපෝෂණයකින් පසුව වඩා සාර්ථකව දියත් කළ හැකි ව්‍යාපෘතියක් පිළිබඳ සැලැස්මක් මෙහි අධ්‍යයනය තුළින් ඉදිරිපත් කර ඇත.